# මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
# තනතුරු පුරප්පාඩු දැන්වීමයි

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ස්ථාපිත සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම් සහිත පළපුරුදු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | තනතුර | තනතුරු සංඛ්‍යාව | සුදුසුකම් |
|---|---|---|---|
| 01 | නියෝජ්‍ය සුබසාධන ප්‍රතිලාභ කොමසාරිස් (මූල්‍ය කළමනාකරණ) MM-1-3 | 02 | I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය, මූල්‍ය කළමනාකරණය, වාණිජ, ව්‍යාපාර අධ්‍යයනය හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක්<br>සහ<br>ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර හතරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.<br>II. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය සහ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර හතරක (04) පළපුරුද්දක් තිබිය යුතු අතර පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආවසරික විභාගයක් සමත් වීම. |
| 02 | සහකාර සුබසාධක කොමසාරිස් (සංවර්ධන හා පර්යේෂණ) MM-1-1 | 01 | I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණය/ ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම (පන්ති සාමාර්ථයක් සහිත උපාධිධාරීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත).<br>සමඟ<br>පළමු උපාධිය අවසන් කිරීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසරක සේවා පළපුරුද්දක් තිබීම.<br>සහ<br>පිළිගත් ආයතනයකින් මාස තුනකට නොඅඩු කාලපරිච්ඡේදයක් ආවරණය වන පරිදි පරිගණක පාඨමාලාවක් හදාරා සහතික පත්‍රයක් ලබා තිබීම. |
| 03 | පද්ධති පරිපාලක JM 1-2 | 01 | I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව / තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය / මෘදුකාංග ඉංජිනේරු උපාධිය<br>හෝ<br>II. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම<br>හෝ<br>III. තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම<br>සහ<br>රාජ්‍ය සේවයක, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක පළපුරුද්දක් තිබිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | | හෝ<br>IV. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 5 වැනි මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br>සහ<br>රාජ්‍ය සේවයක, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක පළපුරුද්දක් තිබිය යුතුය. |
| 04 | මෘදුකාංග සංවර්ධක<br>JM 1-2 | 01 | I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව / තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය / මෘදුකාංග ඉංජිනේරු උපාධිය<br>හෝ<br>II. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම<br>හෝ<br>III. තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br>සහ<br>රාජ්‍ය සේවයක, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක පළපුරුද්දක් තිබිය යුතුය.<br>හෝ<br>IV. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 5 වැනි මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br>සහ<br>රාජ්‍ය සේවයක, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක පළපුරුද්දක් තිබිය යුතුය. |
| 05 | තොරතුරු තාක්ෂණ විධායක<br>JM 1-2 | 01 | I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව / තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය / මෘදුකාංග ඉංජිනේරු උපාධිය<br>හෝ<br>II. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br>හෝ<br>III. තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br>සහ<br>රාජ්‍ය සේවයක, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ |

| | | | |
|---|---|---|---|
| | | | පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක පළපුරුද්දක් තිබිය යුතුය.<br>හෝ<br>IV. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 5 වැනි මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br>සහ<br>රාජ්‍ය සේවයක, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක පළපුරුද්දක් තිබිය යුතුය. |
| 06 | සංවර්ධන නිලධාරී MA-3 | 03 | I. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසු විෂය සංයෝජන සහිත උපාධියක් |
| 07 | කාර්යාල සහායක PL-1 | 03 | I. අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටි පුද්ගලයින්. |

**වයස :**

**නියෝජ්‍ය සුබසාධන ප්‍රතිලාභ කොමසාරිස් -** [අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.]

**සහකාර සුබසාධක කොමසාරිස් -** [අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.]

**පද්ධති පරිපාලක, මෘදුකාංග සංවර්ධක, තොරතුරු තාක්ෂණ විධායක, සංවර්ධන නිලධාරී -** [වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.]

**කාර්යාල සහායක -** [අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.]

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර ඉන් ලබාගන්නා ලකුණු වල ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**බඳවාගැනීමේ කොන්දේසි :**

මෙම තනතුරු ස්ථිරය. තනතුර ස්ථිර කිරීමට පෙර වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.

**මාසික වැටුප :**

MM 1-3 - 2016 රු. [55,925 - 10 x 1,375 - 15 x 1,910 - 98,325] + රජයේ අනුමත වෙනත් දීමනා,
MM 1-1-2016 රු. [53,175 – 10 x 1,375 – 15 x 1,910 – 95,575] + රජයේ අනුමත වෙනත් දීමනා,
JM 1-2 - 2016: Rs. [43,355 - 10 x 755 - 18 x 1,135 – 71,335] + රජයේ අනුමත වෙනත් දීමනා,
MA 3 - 2016 - Rs. [32,200 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 5 x 750 - 54,960] + රජයේ අනුමත වෙනත් දීමනා,
PL 1-2016 Rs. [24,750 – 10 x 250 – 10 x 270 – 7 x 300 – 15 x 330 – 37,000] + රජයේ අනුමත වෙනත් දීමනා,
වැටුපෙන් 8% ක් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු අතර සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් 12%ක් රජයේ දායක මුදල් ලෙස ගෙවනු ඇත. තවද, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3% ක දායක මුදලක් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් ගෙවනු ලැබේ.

ආදර්ශ අයදුම්පත්‍රය පහත වෙබ් අඩවි වලට පිවිසීමෙන් බාගත කර ගත හැකිය.
https://www.treasury.gov.lk/web/ministry-of-finance-vacancies/section/current%20vacancies
https://www.wbb.gov.lk/web/si/jobs

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2024.08.02 දින හෝ එදිනට පෙර **කොමසාරිස්, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය, ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, නො. 191, ධර්මපාල මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. රජයේ / සංස්ථා වල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතනය වල ප්‍රධානීන් මාර්ගයෙන් යොමුකළ යුතුය. පමා වූ, අසම්පූර්ණ හෝ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනෙන් පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

තවද, **අයදුම්පත් බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.** මෙම දැන්වීම අවලංගු කිරීම, සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීම සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය සේ සැලකිය යුතුය.

**කොමසාරිස්**
**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය**
**මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**